# 2023 ක් වූ පෙබරවාරි මස පවත්වන ලද අකුරණ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව

දිනය :- 2023.02.02

වේලාව :- පෙ.ව 9.30

ස්ථානය :- අකුරණ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම් ශාලාව

මුලසුන :- ගරු සභාපති අයි. එම්. ඉස්තිහාර් මැතිතුමා

## පැමිණීම

01. ගරු සභාපති - අයි. එම්. ඉස්තිහාර් මැතිතුමා
02. ගරු ගරු උප සභාපති - ඒ. එම්. සරත් අමරකෝන් මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්. ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී. ජී. සිරිමල් විජේතුංග මැතිතුමා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. එම්. ඒ. අනුරුද්ධ කුමාර ජයසුන්දර මැතිතුමා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. එෆ්. එම්. අජ්මීර් මැතිතුමා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. එච්. ජී. එස්. එම්. මිහුරාර් මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්. නිලාම් මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.එම්. මුෆීද් මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ඒ.යූ. රහ්මාන් මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එච්.එම් නසාර් මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී. ගාමිණී වසන්ත කුමාර මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ. ජී. ස්වර්ණලතා මැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්. ආර්. එම්. ඉස්මයිල් මැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බි.කේ.ජී. සීලවතී මැණිකේ මැතිතුමිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ජී. නිල්මිණි දමයන්ති මැතිතුමිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. ඒ. අස්මීර් අලි මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. එම්. නිහිමතුනිසා මැතිතුමිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.අයි. මොහමඩ් මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී. නිරංජන් කරුණාරත්න මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්ලිව්.ඒ.ඒ.හජ්ජු මොහිදීන් මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ආර්.එම් සරුක් මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.එස්.එම් හුසෙයින් මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම් ශාන්ත සෙනවිරත්න මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ සිත්ති රෝසාන් මැතිතුමිය

## නොපැමිණීම

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එෆ්. නිස්රිනා ෂරුක් මැතිතුමිය
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ඒ.එච්.එම් සව්රාජ් මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එස්.එම්. හස්වර් මැතිතුමා

## සහභාගී වූ නිලධාරීන්

01. ලේකම් - ඩි.ජී.එම්.බී රණසිංහ මයා
02. සංවර්ධන නිලධාරී - පී.ජී.අයි.එස් මනතුංග මිය
03. සංවර්ධන නිලධාරී - එච්. එම්. ඩබ්. බී. නයනමාලි මිය

**<u>(අ) පසුගිය මහා සභා වාර්තාව සහා සම්මත කිරීම</u>**

2023 ජනවාරි මස 03 වන දින පැවති සාමාන්‍ය මහා සභාවේ වාර්තාව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට සහ ගරු මන්ත්‍රීතුමියන්ලාට ලැබී ඇති බැවින් එම වාර්තාවේ සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
සංශෝධන නොමැති බැවින් 2023 ජනවාරි මස 03 වන දින පැවති සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්ලිව්.ඒ.ඒ.හජ්ජු මොහිදීන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>(ආ) ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>**

**(ආ.1** පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්ගේ අත්සනින් යුතුව අංක සීපීසී/ සී එල්ජී /3 /5 /1 හා 2022.01.12 දිනැති ලිපියට අනුව "පූර්ණ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම - 2021 වර්ෂය" යන හිසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලද අතර මුදල් කමිටුවට ඉදිරිපත් කර අඩු පහඩු සකස් කිරීමත් පසු විපරම් කිරීමට කටයුතු කරන ලෙසත් දන්වා සිටින ලදී .

**(ආ.2** පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් එවන ලද CPC/ACLG/K/AM/10/01/06 හා 2022.12.03 දිනැති ලිපියට අනුව "2022 නොවැම්බර් මස 08 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම" යන හිසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**(ආ. 3** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ නව වැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභා වාරයේ, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183 - රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**(ආ. 4** රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන්, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මේ මස මන්ත්‍රී දීමනාව මේ වන තෙක් ප්‍රතිපූර්ණය කර නොමැති බැවින් එම මුදල් ප්‍රතිපූර්ණය වීමෙන් පසුව මන්ත්‍රී දීමනා ගෙවීම සිදු කරන බව සභාපති තුමා විසින් සභාව දැනුම්වත් කරන ලදී.

**<u>(ඇ) සභාවට ලැබී ඇති ලිපි, සංදේශ, පෙත්සම් ඉදිරිපත් කිරීම - කිසිවක් නැත</u>**

**(ඇ) <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - කිසිවක් නැත</u>**

## (ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා

### ඉ.1 ගරු සභාපති අයි. එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා

**ඉ.1.1** පළාත් පාලන කොමසාරිස්තුමා විසින් 2023-01-17 වන දින යොමු කරන ලද ලිපියට අනුව GIS තාක්ෂණය ඔස්සේ පළාත් පාලන ආයතන සතු මාර්ග, සිතියම් ගත කිරීම සඳහා එකඟතාවය විමසා ඇත. මෙම තාක්ෂණික ක්‍රමවේදය ඔස්සේ මාර්ග සිතියම් ගත කිරීම කාලෝචිත හා වියදම් අවම මෙන්ම සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණයට ද පහසු ක්‍රමයක් වන බැවින් එම තීරණයට සභාවේ එකඟතාවය ලබාදීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඒ. අස්මීර් අලි මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.1 පළාත් පාලන කොමසාරිස්තුමා විසින් 2023-01-17 වන දින යොමු කරන ලද ලිපියට අනුව අකුරණ ප්‍රාදේශීය සභාව සතු මාර්ග, සිතියම් ගත කිරීම සඳහා GIS තාක්ෂණික ක්‍රමවේදය ඔස්සේ මාර්ග සිතියම් ගත කිරීම කාලෝචිත හා වියදම් අවම මෙන්ම සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණයට ද පහසු ක්‍රමයක් වන බැවින් එම තාක්ෂණික ක්‍රමවේදය භාවිතා කර ප්‍රාදේශීයසභා මාර්ග විධිමත් කිරීම සුදුසු බවත්, එම තීරණයට සභාවේ එකඟතාවය ලබාදීම සුදුසු බවත් මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.2** අකුරණ පිහා ඔයේ ගංවතුර පාලනය කිරීම සඳහා වන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ මෙහෙයවීම මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියේ පහසුකම් සැලසීම සඳහා වැලි ඉවත් කිරීමට, ලොරි රථ දෙකක සේවය ලබා ගැනීමට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ වූ යෝජනාව.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ. එම්. ඒ. අනුරුද්ධ කුමාර ජයසුන්දර මැතිතුමා,
මෙම ව්‍යාපෘතියට වාහන යොදා ගන්නා ක්‍රමවේදය පිළිබඳව සභාවෙන් විමසන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,
මෙහි දී වාහන යොදවා ගැනීමට ටෙන්ඩර් පටිපාටිය යොදා ගන්නා බව ප්‍රකාශ කර සිටින ලදී.
මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.2 අකුරණ පිහා ඔයේ ගංවතුර පාලනය කිරීම සඳහා වන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ මෙහෙයවීම මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියේ පහසුකම් සැලසීම සඳහා ලොරි රථ දෙකක සේවය ලබා ගැනීමත් ඒ සඳහා සභා අරමුදල් යෙදවීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.3** මිනි මාර්කට් කඩ කාමර අංක 03, අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ 190/2/2, 190/2/16 යන කඩ කාමර සඳහා බොහෝ කලක සිට ගිවිසුම් කාලය අවසන් වී ඇත. ඒ සඳහා ගිවිසුම් අලුත් කිරීම සම්බන්ධව අවසන් දැනුම් දීම යොමු කළ ද කිසිදු බදුකරුවෙකු ඉදිරිපත් වී නොමැත. එබැවින් මෙම කඩ කාමර 03 සඳහා ගිවිසුම් සමාප්ත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| **කඩ කාමර අංක** | **බදුකරු** |
|---|---|
| 01) මිනි මාර්කට් කඩ කාමර අංක 03 | එස් .ඒ .එම් .අනීස් මයා |
| 02) අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 190/2/2 | ඩබ් .ජී .එම් .ඒ .රාසික් මයා |
| 03) අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 190/2/16 | ජේ .එම් .එල් .ඉස්මයිල් මයා |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,
මෙම කඩ කාමර සඳහා කුලී ගෙවන ලෙස කඩ කාමර හිමියන්ට බොහෝ වාරයක දී ලිපි මගින් දැනුම්වත් කළ ද එම ගෙවීම් කටයුතු සිදු නොකරන බැවින් මෙම කඩ කාමර 03 සඳහා ගිවිසුම් සමාප්ත කිරීම සුදුසු බව තව දුරටත් ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.3 මිනි මාර්කට් කඩ කාමර අංක 03 අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ 190/2/2, 190/2/16 යන කඩ කාමර සඳහා බොහෝ කලක සිට ගිවිසුම් කාලය අවසන් වී ඇත. ඒ සඳහා ගිවිසුම් අලුත් කිරීම සම්බන්ධව අවසන් දැනුම් දීම යොමු කළ ද කිසිදු බදුකරුවෙකු ඉදිරිපත් වී නොමැත. එබැවින් මෙම කඩ කාමර 03 සඳහා ගිවිසුම් සමාප්ත කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.4** 2023 වර්ෂය සඳහා මුදල් කමිටුවට පවරන ලද බල තල වලට අමතරව 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අකුරණ ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් මණ්ඩලය ලෙස කටයුතු කිරීමටත් මහ සභාව සඳහා නිර්දේශ හා උපදේශ ලබා දීමට බලය පැවරීමත් සුදුසු බවට යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. එම්. සරත් අමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.4 2023 වර්ෂය සඳහා මුදල් කමිටුවට පවරන ලද බල තල වලට අමතරව 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අකුරණ ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් මණ්ඩලය ලෙස කටයුතු කිරීමටත් මහ සභාව සඳහා නිර්දේශ හා උපදේශ ලබා දීමට බලය පැවරීමත් සුදුසු බව මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.5** 2023 වර්ෂයට අදාළ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය මහ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.5 2023 වර්ෂයට අදාළ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය අනුව සැපයුම්කරුවන් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් ලෙස පිළිගනිමින්, ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.6** අකුරණ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ පහත ස්ථාන වල සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

01.අලවතුගොඩ මහජන පුස්තකාලය

02.අකුරණ හා ඇල්ලෙකඩේ පුස්තකාලය

03.ආයුර්වේදය, දීගල හා දිප්පිටිය පෙර පාසල

04.කාර්යාලය, පුද්ගලික ඉන්වෙන්ට්‍රිය, ඊ නැණ පියස, පාරිභෝජ්‍ය ගබඩාව හා ප්‍රධාන ගබඩාව

05.වාහන, කොම්පෝස්ට් අංගනය හා උප කාර්යාලය

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.6 අකුරණ ප්‍රාදේශීය සභාවට අයත් පහත නම් සඳහන් ස්ථාන වල 2022.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුමත කිරීමත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කිරීමත් සුදුසු බව මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**01.අලවතුගොඩ මහජන පුස්තකාලය**

**02.අකුරණ හා ඇල්ලෙකඩේ පුස්තකාලය**

**03.ආයුර්වේදය, දීගල හා දිප්පිටිය පෙර පාසල**

**04.කාර්යාලය, පුද්ගලික ඉන්වෙන්ට්‍රිය, ඊ නැණ පියස, පාරිභෝජ්‍ය ගබඩාව හා ප්‍රධාන ගබඩාව**

**05.වාහන, කොම්පෝස්ට් අංගනය හා උප කාර්යාලය**

**ඉ.1.7** 2021 වර්ෂයේ කොරෝනා වසංගත තත්වය මත 2021 ජුනි, ජූලි හා අගෝස්තු මාස සඳහා ත්‍රිරෝද රථ ගාස්තු අය කිරීම අත්හැරිම සඳහා 2022.01.13 දින පැවති මහ සභාවෙන් තීරණය වී ඇත. ඒ අනුව බල පත්‍ර ලාභී ත්‍රිරෝද රථ හිමියන් 429 දෙනෙකු විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එම 429 දෙනාහට ඉහත මාස 03ක ගාස්තුව (429 x 750) රු.321,750.00 ක මුදල කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.එම් සරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.7 2021 වර්ෂයේ කොරෝනා වසංගත තත්ත්වය මත 2021 ජුනි, ජූලි හා අගෝස්තු මාස තුන සඳහා සභාවට අයත් ත්‍රිරෝද රථ 429 ක් වෙතින් සභාවට අය විය යුතු ත්‍රිරෝද රථ ගාස්තු රු.321,750.00 ක් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය අනුව ආදායම අත්හැරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.8** අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාල පරිශ්‍රය, යාළුගහවෙල කසල බැහැර කරන ස්ථානය හා කොම්පෝස්ට් අංගනය සඳහා දේශීය සංවර්ධන ණය අරමුදලින් සෝලා පැනල 03 ක් (සූර්ය කෝෂ 03ක් ) ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.8 අකුරණ ප්‍රාදේශීය සභාවට අයත් කාර්යාල පරිශ්‍රය, යාළුගහවෙල කසල බැහැර කරන ස්ථානය හා කොම්පෝස්ට් අංගනය යන ස්ථාන වල පවතින ඉහළ මහල් භාවිතා කර සූර්ය විදුලිය ජනනය කිරීමත්, ඒ සඳහා දේශීය සංවර්ධන ණය අරමුදල් භාවිතා කර සෝලා පැනල 03 ක් (සූර්ය කෝෂ 03ක් ) ලබා ගැනීමත්, එම අමතර විදුලිය ජාතික විදුලිබල පද්ධතියට ලබා දීම මගින් ආදායමක් ඉපයීමත් සුදුසු බව මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.9** හදිසි ආපදා තත්ත්වය මත අවහිර වූ මාර්ග පිළිසකර කිරීම උදෙසා අලවතුගොඩ ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන අංක 72492537 දරණ රු. 2,475,346.00 ක (විසි හතර ලක්ෂ හැත්තෑ පන් දහස් තුන්සිය හතලිස් හයක) ස්ථාවර තැන්පතුව නිදහස් කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

01 . කෝදාගොඩ වත්ත පාර සංවර්ධනය කිරීම

02. අස්නාපුර පඩිපෙළ සංවර්ධනය කිරීම

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.9 අකුරණ ප්‍රදේශයේ හදිසි ආපදා තත්ත්වයට ලක්ව මාර්ග ප්‍රවාහනය හා අත්‍යවශ්‍ය සේවා සපයා ගැනීමට නොහැකි මාර්ග පිළිසකර කර ගැනීම උදෙසා අලවතුගොඩ ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන අංක 72492537 දරණ රු. 2,475,346.00 ක (විසි හතර ලක්ෂ හැත්තෑ පන් දහස් තුන්සිය හතලිස් හයක) ස්ථාවර තැන්පතුව නිදහස් කර ගැනීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**01. කෝදාගොඩ වත්ත පාර සංවර්ධනය කිරීම**
**02. අස්නාපුර පඩිපෙළ සංවර්ධනය කිරීම**

**ඉ.2 ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමාගේ යෝජනා (2023.01.05, 2023.01.13, 2023.01.23 සහ 2023.01.27 දිනවල පැවති මුදල් කමිටු නිර්දේශ)**

**ඉ.2.1** අකුරණ ප්‍රාදේශීය සභාවේ වාණිජ කොටස රාජ්‍ය ආයතනයක් වන මහජන බැංකුව වෙත දීර්ඝ කාලීනව බදු පදනම මත ලබා දී ඇති බැවින්, 2023.02.28 වන දිනෙන් පසුව කුලී ගිවිසුම අලුත් කිරීමේ දී 10% ක් වැඩි කිරීමේ පදනම මත නව මාසික කුලිය රු. 121,000.00 ලෙස සළකා ඉදිරි වසරක කාලයක් සඳහා මහජන බැංකුව වෙත ලබා දී ඇති කුලී ගිවිසුම අලුත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. එම්. සරත් අමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.2.1 අකුරණ ප්‍රාදේශීය සභාවේ වාණිජ කොටස රාජ්‍ය ආයතනයක් වන මහජන බැංකුව වෙත දීර්ඝ කාලීනව බදු පදනම මත ලබා දී ඇති බැවින්, 2023.02.28 වන දිනෙන් පසුව කුලී ගිවිසුම අලුත් කිරීමේ දී 10% ක් වැඩි කිරීමේ පදනම මත නව මාසික කුලිය රු. 121,000.00 ලෙස සළකා ඉදිරි වසරක කාලයක් සඳහා මහජන බැංකුව වෙත ලබා දී ඇති කුලී ගිවිසුම අලුත් කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී. (පැරණි මාසික කුලිය රු.110,000.00)**

**ඉ.2.2** එස්.එම්.එස් මොහොමඩ් යන අය විසින් සිදු කළ ඉල්ලීමට අනුව අංක: 232, මාතලේ පාර, අකුරණ යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ගව මස් වෙළඳසැල අංක: 29, මාතලේ පාර, අකුරණ යන ස්ථානයට මාරු කිරීම සඳහාත්, ගව මස් වෙළඳසැලේ ස්ථානය මාරු කිරීමට අදාළ දැන්වීම ගැසට් පත්‍රයේ පල කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. එෆ්. එම්. අජ්මීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.2.2 එස්.එම්.එස් මොහොමඩ් යන අය විසින් සිදු කළ ඉල්ලීමට අනුව අංක: 232, මාතලේ පාර, අකුරණ යන ස්ථානයේ පවත්වා ගෙන යනු ලබන ගව මස් වෙළඳසැල අංක: 29, මාතලේ පාර , අකුරණ යන ස්ථානයට මාරු කිරීම සඳහාත්, ගව මස් වෙළඳසැලේ ස්ථානය මාරු කිරීමට අදාළ විරෝධතා පරික්ෂණ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.2.3** එස්.එම්.එස් මොහොමඩ් යන අය විසින් සිදු කළ ඉල්ලීමට අනුව අංක: 216/ඊ, මාතලේ පාර, අකුරණ යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ගව මස් වෙළඳසැල අංක: 232, මාතලේ පාර , අකුරණ යන ස්ථානයට මාරු කිරීම සඳහාත්, ගව මස් වෙළඳසැලේ ස්ථානය මාරු කිරීමට අදාළ දැන්වීම ගැසට් පත්‍රයේ පල කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඒ. අස්මීර් අලි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,
මෙම මස් වෙළඳසැල් අවශ්‍ය නිර්ණායකයන්ට අනුකූලව පවතින බැවින් මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු වන බව තව දුරටත් ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.2.3 එස්.එම්.එස් මොහොමඩ් යන අය විසින් සිදු කළ ඉල්ලීමට අනුව අංක: 216/ඊ, මාතලේ පාර, අකුරණ යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ගව මස් වෙළඳසැල අංක: 232, මාතලේ පාර , අකුරණ යන ස්ථානයට මාරු කිරීම සඳහාත්, ගව මස් වෙළඳසැලේ ස්ථානය මාරු කිරීමට අදාළ විරෝධතා පරික්ෂණ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.2.4** 2023 වර්ෂයේ පොදු අරමුදලින් සිදු කිරීමට නියමිත අලවතුගොඩ නගරයේ වැසිකිලි පද්ධතිය සංවර්ධනය කිරීමේ යෝජනාව සඳහා වන රු.4,700,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුවට අනුමැතිය ලබාදීමත්, මෙම ව්‍යාපෘතිය සඳහා සීමිත ප්‍රසම්පාදන ක්‍රමවේදය භාවිතා කරමින් කඩිනමින් ඉටු කර ගැනීමත් සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.2.4 2023 වර්ෂයේ පොදු අරමුදලින් සිදු කිරීමට නියමිත අලවතුගොඩ නගරයේ වැසිකිලි පද්ධතිය සංවර්ධනය කිරීමේ යෝජනාව සඳහා වන රු.4,700,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුවට අනුමැතිය ලබාදීමත්, මෙම ව්‍යාපෘතිය සඳහා සීමිත ප්‍රසම්පාදන ක්‍රමවේදය භාවිතා කරමින් කඩිනමින් ඉටු කර ගැනීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**<u>ඉ.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.චමින්ද තිලකරත්න මැතිතුමාගේ යෝජනා (2023.01.19 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු නිර්දේශ )</u>**

**ඉ.3.1** 2023.01.19 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ අංක 01–i-(අ ) නිර්දේශය වන ආයුර්වේද වෛද්‍යාතුමිය විසින් ඉදිරිපත් කළ ඖෂධ ලේඛන අනුව 2023 වර්ෂයේ මුල් කාර්තුව සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාවෙන් රු.300,000.00 ක ඖෂධ ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එම්. මුෆීද් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.1 2023.01.19 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ අංක 01–i-(අ ) නිර්දේශය වන ආයුර්වේද වෛද්‍යාතුමිය විසින් ඉදිරිපත් කළ ඖෂධ ලේඛන අනුව 2023 වර්ෂයේ මුල් කාර්තුව සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාවෙන් රු.300,000.00 ක ඖෂධ ලබා ගැනීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.2** 2023.01.19 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ අංක 03–i-(අ ) නිර්දේශය වන දීගල සහ දිප්පිටිය පෙර පාසල් දෙක සඳහා 2023 වර්ෂයට බඳවා ගනු ලබන එක් සිසු දරුවෙකු වෙනුවෙන් නිල ඇඳුම් දෙක බැගින් ලබා දීමත්, එක් පෙර පාසලක් සඳහා අමතර ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දීමත් සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එම්. මුෆීද් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.2 2023.01.19 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ අංක 03–i-(අ ) නිර්දේශය වන දීගල සහ දිප්පිටිය පෙර පාසල් දෙක සඳහා 2023 වර්ෂයට බඳවා ගනු ලබන එක් සිසු දරුවෙකු වෙනුවෙන් නිල ඇඳුම් කට්ටල දෙක බැගින් ලබා දීමටත්, හදිසි අවස්ථාවක් සඳහා භාවිතා කළ හැකි වන ලෙසට එක් පෙර පාසලක් සඳහා අමතර ඇඳුම් කට්ටල 02 ක් බැගින් ලබා දීමත්, ඒ සඳහා රු. 235,200.00ක මුදලක් සභා අරමුදලින් දැරීම සුදුසු වන බවත් මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

<u>**ඉ.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමාගේ යෝජනා (2023.01.19 දින පැවති කර්මාන්ත කමිටු නිර්දේශ)**</u>

**ඉ.4.1** 2023.01.19 දිනැති කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන ලද කර්මාන්ත ඉටු කිරීම හා ඇස්තමේන්තු අනුමත කිරීමට අදාළ අංක 01 - 20 දක්වා වන නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.අයි. මොහමඩ් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.4.1 2023.01.19 දිනැති කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන ලද කර්මාන්ත ඉටු කිරීම හා ඇස්තමේන්තු අනුමත කිරීමට අදාළ අංක 01 - 20 දක්වා වන නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.4.2** 2023 වසර සංවර්ධන යෝජනා සඳහා මා හට වෙන් කළ මුදලින් රු.200,000.00 ක මුදලක් විලාන ගල්අංග මාර්ගය සංවර්ධනය සඳහා වෙන් කර ඇත. එම යෝජනාව සංශෝධනය කර බලකඩුව ඇල්ලේකඩේ මාර්ගයේ බෝක්කුව ප්‍රතිසංස්කරණය සඳහා ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.අයි. මොහමඩ් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.4.2 2023 වසර සංවර්ධන යෝජනා සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී. අමරජීව ඉන්ද්‍රකුමාර මැතිතුමා හට වෙන් කළ මුදලින් රු.200,000.00 ක මුදලක් විලාන ගල්අංග මාර්ගය සංවර්ධනය සඳහා වෙන් කර ඇත. එම යෝජනාව සංශෝධනය කර බලකඩුව ඇල්ලකඩේ මාර්ගයේ බෝක්කුව ප්‍රතිසංස්කරණය සඳහා ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**<u>ප්‍රාදේශීය සභා රීති මාලාවේ 11 (8) රීතිය අනුව කල් දි නොමැති යෝජනා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමාගේ යෝජනා</u>**

**ඉ.5.1** 2022.12.13 දින පවත්වන ලද අකුරණ ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක ඉ.7 යටතේ වෙන් කරන ලද රු.2,000,000.00 ක මුදල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී පවුල් වල අධ්‍යාපනය ලබන සිසු දරුවන් 473 ක් සඳහා අත්‍යවශ්‍ය පාසල් උපකරණ ලබා දීම සඳහා හඳුනාගෙන ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.5.1 1 2022.12.13 දින පවත්වන ලද අකුරණ ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක ඉ.7 යටතේ වෙන් කරන ලද රු.2,000,000.00 මුදල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී පවුල් වල අධ්‍යාපනය ලබන සිසු දරුවන් 473 ක් සඳහා අත්‍යවශ්‍ය පාසල් උපකරණ ලබා දීම සඳහා හඳුනාගෙන ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## <u>(ඊ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>

## <u>ඊ.1 මුදල් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම</u>

2023 ජනවාරි මස 2023.01.05, 2023.01.13, 2023.01.23 සහ 2023.01.27 යන දිනයන්හි පැවති මුදල් කමිටු වාර්තා මුදල් කමිටු ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**ඊ.2 පරිසර කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම**

2023 ජනවාරි මස 17 දින පැවති පරිසර කමිටු වාර්තාව පරිසර කමිටු ගරු සභාපති එම්.එෆ්.එම්.අජ්මීර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**ඊ.3 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම**

2023 ජනවාරි මස 19 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු ගරු සභාපති වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**ඊ.4 කර්මාන්ත කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම**

2023 ජනවාරි මස 19 දින පැවති කර්මාන්ත කමිටු වාර්තාව කර්මාන්ත කමිටු ගරු සභාපති ආර්.ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**( උ) ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම**

2022 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**(ඌ ) වෙනත් කරුණු**

**1.ගරු මහජන නියෝජිතයින්ගේ නිවාඩු අනුමත කිරීම**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එෆ්. නිස්රිනා ෂරුක් මැතිතුමිය, එම්.ඒ.එච්.එම් සච්රාජ් මැතිතුමා සහ එම්.එස්.එම්. හස්වර් මැතිතුමා අද දින මහා සභාවට නොපැමිණෙන බව දුරකතනයෙන් දන්වා නිවාඩු අනුමත කර දෙන මෙන් සිදු කළ ඉල්ලීම ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

එම නිවාඩු ඉල්ලීම් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(එ) ඉදිරි මහා සභා දිනය තීරණය කිරීම**

- ඉදිරි මහා සභා දිනය 2023 මාර්තු 14 වන දින බව සභාවට දැනුම් දෙන ලදී.

**(ඒ) මහා සභාව අවසන් කිරීම**

එදිනට නියමිත න්‍යාය පත්‍රයේ කටයුතු අවසන් වූ බැවින් පෙ.ව 10.03 ට මහා සභා කටයුතු අවසන් විය.

අයි.එම් ඉස්තිහාර්,

සභාපති,

අකුරණ ප්‍රාදේශීය සභාව,

අලවතුගොඩ.